

ලක්රුහුණු මාසික දහම් පත්‍රය

# අමා ගඟුල

December 2015 Uduwap

# බුදුහිමියන් වදාළ අංග හයකින් යුතු දානය.

**ශ්‍රී. බු. ව. 2559 ක්වූ උදුවප් මස කලාපය, රාජ්‍ය වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 24 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

( අඞගුත්තර නිකාය - ඡලඞගදාන සූත්‍රය ඇසුරිනි)

ධම්කාමී පින්වතුනි,

අද උඳුවප් පුර පොහොය දිනයයි. තථාගත ශ්‍රී සම්බුධ ශාසනයෙහි සිවුවනක් පිරිසෙහි දෙවැනි ශ්‍රාවක පිරිස වූ භික්ෂුණීන් වහන්සේලාගේ ආරම්භය සහ සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ මහා බෝධි දක්ෂිණ ශාඛාව ලක් දිවයිනට වැඩමකරවීම බුධ වර්ෂ 284 වැනි වසරේ දී උඳුවප් පුර ලැබී අටවක දා සිරිලකට අනුබුදු පරම කල්‍යාණ මිත්‍ර මහා මහේන්ද්‍ර මහරහතන් වහන්සේ අම්බස්ථලයේදී පිරිනිවනට පත් වීම. වැනි විශේෂ සිද්ධි ආගමික වශයෙන් සිහිපත් කිරීමද 2004 වසරේ මෙවැනි උඳුවප් පුර පොහොය දිනක මුහුදු පතුලේ වූ භූකම්පනය නිසා මුහුද ගොඩට පැමිණ දහස් ගණනක් අපරට ජනතාව ඇතුළු ජනතාව විපතට පත් වීම ද සිහිකර පිං පෙත් අනුමෝදන් කරන අවස්ථාවේ දී මෙම දහම් පණිවිඩයෙන් බලාපොරොත්තු වන්නේ අප සිදු කරන දාන මාන ආදී පිං දහම් බුදුරජාණන් වහන්සේගේ අවවාදයට අනුව සිදු කර එහි ඵල ලබා ගන්නා ආකාරය පිළිබඳව විමසා බැලීමට උපකාර කිරීමයි. මේ සඳහා මාතෘකාව වන්නේ සම්බුද්ධ දේශනාවෙහි සූත්‍ර පිටකයෙහි අඞ්ගුත්තර නිකායෙහි ඡකක නිපාතයෙහි සඳහන් ඡලඞග දාන සූත්‍රයයි. ඉතා වැදගත් උපදේශනයක් ලබා දෙන මෙම සූත්‍රය හැකි පමණින් දැන ඉගෙන තමන්ගේත් තම මිය ගිය ඥාතීන් ඇතුළු සියළු සත්වයන්ගේ ද උභය ලෝකාර්ථ උදා කර ගනිමු.

මේ සූත්‍රය දේශනා කරන විට බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවන නම් ආරාමයේය. එකල වෙළුකණ්ටක නුවර නන්ද මාතා නම් වූ උපාසිකාව සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ඇතුළු භික්ෂු සංඝයා වහන්සේලාට දානයක් දෙන බවත් එහි බුදුරජාණන් වහන්සේලා අනුමත කරන අංග හයකින් සමන්විත බව දිව්‍ය ඤාණයෙන් දැක ජේතවනයෙහි වැඩසිටින බුදුහිමියන් එහි වැඩ සිටින භික්ෂු සංඝයා වහන්සේ අමතා මහණෙනි, නන්දමාතා උපාසිකාව භික්ෂු සංඝයා කෙරෙහි අංග හයකින් පරිපූර්ණවූ

දානයක් දෙනවා, ඒ කරුණු හය සමන්විත වන්නේ දායකයාගේ අංග තුනක්ද ප්‍රතිග්‍රාහක හෙවත් දානය (දක්ෂිණාව) ලබන්නාගේ අංග තුනක්ද වීමෙනුයි.

එහි දායකයාගේ අංග තුන වන්නේ කුමක්ද? (කතමානි දයකසස තීණඞගානි?) දානය දීමට පෙර සිත සොම්නස් විය යුතුයි. (පුබෙබව දානා සුමනා හොති ) දන්දෙන අවස්ථාවේදී සිත ප්‍රසන්න විය යුතුය. (දදං චිතතං පසාදෙති) දානය දීමෙන් පසුද සතුටු සිතක් විය යුතුයි. (දත්වා අතත මනො හොති )

ප්‍රතිග්‍රාහකයාගේද අංග තුනකි ඒ කුමක්ද? (කතමානි පටිගගාහකා නං තීණ ඞගානි? )දනය ලබන්නා රාගය දුරු කළ (වීතරාගා) හෝ රාගය දුරු කිරීමට හික්මෙන (රාග විනයාය) කෙනෙකු හෝ ද්වේෂය දුරු කළ (වීත දෙසා) කෙනෙකු හෝ ද්වේෂය දුරු කිරීමට හික්මෙන (දෙසවිනයාය) කෙනෙකු හෝ මෝහය දුරු කළ (වීත මෝහා) කෙනෙකු හෝ මෝහය දුරු කිරීමට හික්මෙන (මෝහ විනයාය) කෙනෙකු හෝ විය යුතුය. මෙසේ අංග හයකින් යුතු දායක ප්‍රතිග්‍රාහක දෙපක්‍ෂයක් වේ නම් ඒ දානය ෂඩඞගසමන්වාගත දක්‍ෂිණාවකි යනුවෙන් වදාරා ඇත.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මෙසේ අංග හයෙන් යුතුව දන් දුන් විට එම පිනෙහි විපාකය මෙතරම් පුණ්‍ය ප්‍රවාහයක්ය. මෙතරම් කුශල ප්‍රවාහයක්ය.සැප ගෙන දෙන්නකි. මෙතරම් සුගති සම්පත්තියට හේතු වෙනවාය. මෙතරම් සැප විපාක ලබා දෙනවාය සුගති සම්පත් සඳහා මෙතරම් හිතකරය. සිතට ප්‍රියමනාප සැප සඳහා මේ තරම් ප්‍රමාණයකට හේතු වණු ඇතැයි ප්‍රමාණ කිරීමට පහසු නැතැයි යනුවෙන් ද සංඛ්‍යාවක් ප්‍රකාශ කළ නොහැකි, ප්‍රමාණය මෙතෙකැයි කිව නොහැකි ආකාරයේ පුණ්‍ය ස්ඛන්ධයකට ඇතුලත්වනවාය යනුවෙන් කිව නොහැකි බව වදළහ. තව දුරටත් පැහැදිලි කිරීමට උපමාවක් දක්වනව. මහණෙනි මහා සාගරයෙහි මෙපමණ දිය නැලි ප්‍රමාණයක්ය හෝ දිය නැලි සිය දහස් ගණනින් දක්වා කිව හැකි නොවන්නාක් මෙන් සංඛ්‍යාවකින් දක්වන්න බැරි අප්‍රමාණ මහ දිය කඳක් සේ මේ ෂඩඞගසමන්වාගත දක්ෂිණාව ප්‍රමාණය කළ නොහැකි පුණ්‍ය උත්පාදනයක් බවද සියළු යහපත ඉපදවීම ද සංඛ්‍යාත්මකව ද ප්‍රමාණ කළ නොහැකිව ලබා දෙන බව ද වදළහ.

ඊලඟට භාග්‍යවතුන් වහන්සේ අංග හයෙන් යුතු දානය මහත්ඵල පිරිපුන් බව තහවුරු කරමින් මෙසේ ගාථා 04 කින් වදාරනව, එහි මේ අර්ථය සිත්හි තබාගත යුතුමය.

**දීමට පළමුව සොම්නස් විය යුතුයි. (පුබ්බ චේතනාව) දෙන අවස්ථාවේදීද සිත පහදවා ගතයුතුය (මුඤ්චන චේතනාව) දීමෙන් පසු සතුටු සිතක් විය යුතුයි.(අපර චේතනාව) මේ දන් දීමෙන් ලබන පිනෙහි පිරිපුන් බවයි. (එසා යඤ්ඤස්ස සම්පදා)**

**රාග (කාමාශාවන්හි ඇලීම) දුරු කළ, ද්වේෂය හෙවත් තරහව දුරු කළ, මෝහය හෙවත් හොඳ නරක සත්‍ය නොදන්නාකම දුරු කළ, ආශ්‍රව හෙවත් කෙලෙස් කසට නැති, කයෙහි වචනයෙහි සංවර වූ බ්‍රහ්මචාරීවූ ඇත්තන් දානය දීමට සුදුසුයි. (ඛෙත්තං යඤ්ඤස්ස සම්පන්නං)**

**තමාගේ දෑතින් දැහැමිව ඉපයූ ධනය වැය කොට තම දෑතින්ම සකසා ඉහත කී ගුණ ඇති උතුමන්ට දීමෙන් ඒ දානය මහත් ඵල වෙයි.**

**මෙසේ ශ්‍රීමත් බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි ශ්‍රද්ධාවෙන් දැරූ ප්‍රඥාවෙන් ඒ දැනුම ඇති පුද්ගලයා ලාභ ලෝභයෙන් දුරු වී දන් දේ ද, ඔහු දුක් නැති (සතර අපායෙන් තොර) සුගතියට එළඹෙන්නෝය.**

නන්දමාතා නම් උපාසිකාව මේ අංග හය පිරිපුන් කොට දන් දීම දුටු බුදුහිමියන් සියළු ලෝක සත්වයාට අනුකම්පාවෙන් භික්ෂූන් වහන්සේ අමතා දේශනා කළ මේ සූත්‍රය එදාටත් වඩා අදට ඉතා වැදගත් වෙයි. පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් තමන්ට හිමි වස්තුවක් අනුන්ට පරිත්‍යාග කිරීම දානය යි දෙන වස්තුවටත් දීමේ ක්‍රියාවටත් දානය යනුවෙන් කීමට අප පුරුදු වී ඇත. එහි පින වනුයේ ඒ වස්තුව නොව, දීම හෙවත් චේතනාවටය. ''දක්ෂිණා'' ''යාග'' යනුවෙන් ද ව්‍යවහාරිකය.

සූත්‍රයේ සඳහන් වන ආකාරයට දන් දීම සඳහා සියල්ලට පළමුව ත්‍රිවිධරත්නය කෙරෙහි යම් පමණක හෝ දැනුම අවශ්‍යය.ඊලගට අවශ්‍ය වන්නේ අඩුම වශයෙන් කර්මය කර්ම ඵලය පිළිබඳ දැනුමය. බුදුරජාණන් වහන්සේ තුන්ලෝ වාසින්ගේ ආමිස සහ ප්‍රතිපත්ති පූජා ලැබීමට සහ පිදීමට සුදුසු (අරහං) ආදී නව මහා ගුණයකින් යුතු බව ඉතා සුළුවෙන් හෝ දැන ඉගෙන ගත යුතුයි. ශ්‍රී සද්ධර්මය මනාකොට දේශනා කර ඇත. (සවාක්ඛාතය) මහා සංඝරත්නය නිවැරදි ප්‍රතිපත්තියකින් යුක්තය. ( සුපටිපන්නො) යනුවෙන් දැන විශ්වාසයක් ඇති කර ගත යුතුය.ත්‍රිවිධ රත්නයට දෑත එකතුකොට වැන්දත් ආනිසංශ ලැබෙනුයේ ඒ නිසාය.

වර්තමානයේ පිං කරන දන්දෙන බොහෝ තැනකම දැකිය හැකි වන්නේ ත්‍රිවිධ රත්නය පිළිබඳ අවබෝධය නැති බවයි. ඒ දුර්වල කම නිසා දානයක ආනිසංස ද හීන වනු ඇත. දන් දීමට පෙර සොම්නස් වීමට. දන් දෙන විට පැහැදීම තිබීමට. දීමෙන් පසු සතුටු වීමට ත්‍රිවිධ රත්නය පිළිබඳව යම්කිසි මූලික දැනුමවත් තිබිය යුතුය. ඒ තැනැත්තාට ලෝභය, ද්වේශය, මෝහය, පහළ නොවේ. ත්‍රිවිධ රත්නය අති දුර්ලභ වන්නේ මෙහි දැක්වෙන පරිදි දන් දීමෙන් ඉහත කී අප්‍රමාණ ආනිශංස ලබාදීමට ශක්තිය ත්‍රිවිධ රත්නය සතු හෙයින්ය. ඒ බව නොදත් මනුෂ්‍යයෝ වෙනත් සුදුසු තැන් සොයති. වෙනත් ක්‍රමෝපායයන් කෙරෙහි කාලය ධනය වැය කරති. ත්‍රිවිධ රත්නයේ වටිනාකම නොපෙනෙනුයේ මෝහය නිසාය. රතන සූත්‍ර දේශනාවේ යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා......යනාදී ගාථාවෙහි සඳහන් පරිදි සුගත ශ්‍රාවක වූ ඒ ආර්ය

පුද්ගලයන් හට කර්ම ඵල අදහා පුදන ලද්ද මහත් ඵලද ඒ සත්‍යයෙන් සත්වයා සුවපත් වේවා. යනුවෙන් දැක්වේ.

ඒ අනුව දන් දීම සඳහා අදත් පරම සුදුස්සෝ සිටිති. ඒ භික්ෂු සංඝයා වහන්සේමය. අනිත් අයට දන් දීම නුසුදුසුයයි. දහමින් කිසිවිටක අවසර නැත. මේ සූත්‍රයට අනුව රාග, ද්වේශ, මෝහ දුරු කළ හෝ ඒ පිළිබඳ හික්මෙන මගට හෝ ඇතුළත් ඇත්තන් සිටිනුයේ පැවත එන මහා සංඝයා වහන්සේ තුළයි. ඒ අතර ඇතැම් විට සීලයෙන් තොර වූ කෙනෙකු සිටිය හැකිය. එය ලෝක ස්වභාවයකි. එසේ වුවද සංඝරත්නය පිරිසිදුය. ඒ බව අංගුත්තර නිකායේ මහා වග්ගයේ පහාරාද සූත්‍රයේ මෙසේ දැක්වෙයි. ''සොහොති මජෙකධ භිකබු සඞඝසස නිසිනෙනා අථබොසො ආරකාව ඝඞඝමහා සඞෙඝ චතෙන'' හේ භික්ෂු සංඝයා මැද සිටියත් ඔහු සංඝයාගෙන් දුරු වූ කෙනෙකි'' ප්‍රඥාව පිහිටුවා ශ්‍රද්ධාව සුරක්ෂා කිරීමට එවැනි තැන් ධර්මය තුළ බොහෝය. අංගුත්තර නිකායේ කමම නිදාන සූත්‍රයේ මෙසේ දැක්වෙයි. ලෝභය කම් ඉපදීමට නිදනයකි. ද්වේශය කම් ඉපදීමට නිදනයකි මෝහය කම් ඉපදීමට නිදනයකි. මහණෙනි එයින් නිරය, තිරිසන් බව, ප්‍රේත ලෝකයම, ඇතිවෙයි. මේ අනුව ලෝභය ද්වේශය මෝහය යනු අකුසල කම් මූලයෝය ඒ කම් විපාක කුසල කම් බවට පත් කර ගැනීමට චේතනාව නිවැරදිව සකස් කළ යුතුය. නන්දමාතා උපාසිකාව ඒ නිවැරදි පිළිවෙත (අංග හයකින් යුතුව ) හඳුනා ගෙන දන් දී ඇත.

බුදුරජාණන් වහන්සේගේ ධම්දේශනාවේ පදනම චේතනාව මූලිකව පවතින නිසා''මනො පුබබඞගමා ධමමා''කර්මයට පූර්ව අංගය මනස බව වදාළහ. එමෙන්ම බිම්බිසාර මහ රජු බුදුහිමියන් ප්‍රධාන සංඝරත්නයට දන් දුන් දවසේ රාත්‍රී බියකරු හඬක් නිසා නින්ද නැති විය. පසු දින බුදුහිමියන්ට කාරණය පැවසීය. ''මහරජ දන් දෙන විට ඔබේ චේතනාව තම මිය ගිය ඥාතීන් උදෙසා මේ දක්ෂිණාව වේවායි සිතෙහි නොවීය. ඒ පෙර බුදු සසුනක දන් දීමට බාධා කළ ඔබේ ඥාතීන්ගේ හැඬීම යැයි '' වදරා එදිනම චේතනාව සකසා දන් දීමට සලස්වා ඥාතීන් සුවපත් කළ බව තිරෝකුඩඩ සූත්‍රයේ දැක්වේ. එසේම, අද ගෙවල් තුළ ඥාතීන්ට පිං දීම ඉතා භයානක ලෙස ඇතැමුන් කියති.එය එසේ නම් ඒ වරද පළමුව කළේ බුදුහිමියන්ම බවට ඉහත කී සිද්ධියෙන් පැහැදිලි වේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය සවාකඛාත හෙයින් අප විසින් වෙනස් කළ යුතු නොවේ වෙනස් කරන අප කරනුයේ වරදකි. ඇතැමුන් තම ඥාතීන්ට පිං දීමට සිඟමන් යදින්නන්ට බත් මුල් බෙදීම.ගැබිනි මව්වරුන්ට දන් දීම, දේවාල මුරුතැන් දන දීම සිදු කරති. මේ සූත්‍රයේ දැක්වෙන පරිදි ආනිශංස එසේ ලැබිය. හැකිද? යන්න ඉහත අර්ථ දක්වා ඇති ගාථා 4 හි අවසන් ගාථා අර්ථයෙන් දැනුවත් වී තේරුම් ගත යුතුය.

කිසිවිටක ඉහත කී දන නුසුදුසු දානයයි. නොකියම් නිර්මල වූ ආයු වර්‍ණ සැප බල සහ නිවන අවශ්‍ය නම් බුද්ධ ශාසනයක පහළ වන මහා සංඝරත්නයට සහ රාග, ද්වේෂ, මෝහ දුරු කිරීමට හික්මෙන වෙනත් සිල්වත් ඇත්තන්ට හෝ දන්දිය යුතුය. දුකට පත් වී නැති බැරි කම නිසා ඔවුන්ට පිහිට වීමට දීම ඉහතකී දානයට සමාන කළ නොහැකිය.

ඡලඞග සමනවාගත දක්ෂිණාව තුළින් අප්‍රමාණ කුසල් ආනිශංස ලැබෙන බව (අථබෝ අසඞෙඛයො‍යා අපපමෙයො‍යා මහා පුඤඤකඛනෙධොසඞඛං ගචජති)දායක ප්‍රතිග්‍රාහක යන දෙපාර්ශ්වයම මේ අංග හය සම්පූර්ණ කළ යුතුය. රාගය, ද්වේෂය, මෝහය පිළිබඳව තේරුම් ගැනීම මෙහිදී දෙපාර්ශ්වයටම අප්‍රමාණ සැපයට හේතු වේ.

අන් හට අලසව නොකොට වි දනය - පින්මිස අනෙකක් නොකොට ප දනය

තුන් සිත පිරිසිදු කොට දුන් දනය - උන් ගිය ගිය තැන ලැබෙයි නි දනය

අලසකමින් අනුන් යෙද වීමක් නොකොට, පින් මිස වෙනත් අරමුණක් නැතිව, තුන් සිත පිරිසිදුව දුන් දානය, ඔවුන් උපනුපන් තැන්හීදී වස්තු සම්පත්තිය ලැබීමට හේතුවෙතැයි ලෝවැඩ සඟරා කතුවරයාද නිධිකණ්ඩ සූත්‍ර අටුවාවට අනුව එසේ පවසා ඇත.

මෙහි සඳහන් කවියෙන් අනුන් යෙදවීමක් නොකොට යනුවෙන් දැක්වුයේ අනුන් සම්බන්ධ කර නොගෙන යන අර්ථය නොව තමන් අලසව අනුන් යෙදවීමයි. එය අගයා සැරියුත් හාමුදුරුවෝ දන් දුන් පිරිසකට අනුමෝදනාවක් සිදුකොට තිබෙනවා ධමම පදයේ යමක වග්ගයේ සඳහන් මේ අවවාදය දන්දෙන සත් පුරුෂයින්ට පමණක් නොව කුමන අඳමේ පිංකමකට වුවද ගැලපෙනු ඇත.

"යමෙක් දන් දෙන කළ අනුන් සමාදන් නොකරවා තමාම දේ ද ඔහු උපනුපන් තැන් හීදී භෝග

සැප ලබයි පිරිවර සැප නොලබයි.

යමෙක් අනුන් සමාදන් කරවා අනුන් ලවාම දේද ඔහු නොදේද ඔහු පිරිවර සැප ලබයි භෝග

සැප නොලබයි.

යමෙක් තමා නොදේද අනුන් සමාදන් නොකරවාද ඔහු මේ සැප දෙකම නොලබයි.

යමෙක් දීමෙහි යෙදී අනුනුත් යොදවාද ඔහු උපනුපන් තැන භෝග සැප පිරිවර සැප දෙකම

ලබයි. නිතරම යස ඉසුරු වැඩේ එයින් අප්‍රමානව සතුටු වෙයි.

ඒ අනුව බුදුරජාණන් වහන්සේ දයක ප්‍රතිග්‍රාහක දෙපක්‍ෂය තුළින් බලාපොරොත්තු වන්නේ කෙසේ හෝ දන් දීමවත් කෙසේ හෝ දන් වැළැඳීමවත් නොව දානයේ ආනිශංසය මෙන්ම සසර දුකින් එතෙර වීමේ මාගීයද මේ තුළින්ම උදා කිරීමටය. එබැවින් දන් දීමෙන් සසර සැපයත් සංවර වීමෙන් (සීලයක පිහිටා දන් දීම) සුගතියත් අත්හැරීමෙන් නිර්වාණයත් යන පරම අභිලාෂයන් මුදුන් පත් කර ගැනීමට අදිටන් කර ගනිමු.

තෙරුවන් සරණයි... !

